**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය - 2013**

---

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ජූනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 කළමනාකරණ භාරය පිහිටුවීම

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2010 මැයි 14 දින ඉදිරිපත් කරන ලද පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය පිහිටුවීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජූනි 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එකී තීරණය ප්‍රකාරව කළමනාකරණ භාරය පිහිටුවා තිබුණ ද 2015 මාර්තු 27 දක්වාම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කළමනාකරණ භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කළමනාකරණ භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** **අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **අහිතකර මතය**

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට **පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ** මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ප්‍රමිති අංක 01**

| | |
|---|---|
| 141 ඡේදය | (අ) වත්කම්වල ධාරණ අගය නිශ්චය කිරීමේදී අනාගත අවිනිශ්චිත සිදුවීම්වල බලපෑම ඇස්තමේන්තු කළ යුතු වුවද රු. 87,951,000 ක් වූ ලැබිය යුතු කඩ කුලී ආදායම මත ඇතිවිය හැකි බොල් ණය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. |
| | (ආ) 2013 වර්ෂය තුළ අයවිය යුතු රු.10,280,000 ක කඩ කුලී භාරයේ අනුමැතිය නොමැතිව ලියාහැර තිබුණි. |
| | (ඇ) තවද 2011 සහ 2012 වර්ෂ වලට අදාළව අයවිය යුතු රු. 22,544,215 ක කුලී ආදායමද අයවීම අවිනිශ්චිත වුවත් අඩමාණ ණය සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සැලැස්වීමට කටයුතු නොකර ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් වල දක්වා තිබුණි. |

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

වත්කමක් එහි ජීවිත කාලය පුරාවට ක්ෂය වන ආකාරයෙන් ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය තීරණය කළ යුතු වුවද, වර්ෂයේ ජනවාරි 01 දිනට පවතින වත්කම් අගය මත ක්ෂය කිරීම භාරයේ ක්ෂය ප්‍රතිපත්තිය වීම හේතුවෙන් වර්ෂය තුළ අත්පත් කරගෙන පරිභෝජනය කරනු ලබන වත්කම් සඳහා එම වර්ෂයේදී ක්ෂය නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශන වලින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොවන බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 10,470,363 ක් වුවද එය රු.9,632,734 ක් ලෙස රු. 837,629 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවයද ඒ හා සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, පොළී ආදායම ගිණුම්ගත කිරීමේදී ඊට අදාළ රු. 837,629 ක රඳවාගැනීමේ බදු ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු. 771,049 ක් වැයකර ඉදිකර තිබූ අපද්‍රව්‍ය ටැංකිය එම වර්ෂය තුළදීම ඉවත් කර තිබුණ නමුත් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.23,132 ක ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) 2011, 2012 හා 2013 වර්ෂ සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු. 18,250 ක් වූ සුභසාධක වියදම් සහ රු. 233,478 ක් වූ පර්යේෂණ වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඉ) නව වෙළඳසැල් 6 කට විදුලි සැපයුම ලබා දීමට වැය කර තිබුණු රු. 433,950 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට ගොඩනැඟිලි අලුත්වැඩියා හා නඩත්තු වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ව්‍යාපාරික කටයුතු සඳහා ලංකා ධීවර සංස්ථාවට ලබා දී තිබූ අයිස් නිෂ්පාදනාගාරය හා වෙළඳ සැල් 4 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු. 5,148,000 ක් ලැබිය යුතු කුලී ආදායම් ගිණුමට හර කිරීම වෙනුවට කළමනාකරණ ගාස්තු නම් වූ වියදම් ගිණුමකට හර කර තිබුණි.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

------------------

බැංකුවට සෘජුව ලැබී ඇති ආදායම් නිශ්චිතව හඳුනාගැනීමට නොහැකිවීම හේතුවෙන් අවිනිශ්චිත ආදායම් ගිණුමකට බැරකර වර්ෂය අවසානයේ ලැබිය යුතු කුලී ආදායමෙන් අනුචිතව අඩුකර දක්වා තිබුණි. මේ අනුව වර්ෂයේ ආදායමේ නිවැරදි ප්‍රමාණය ගිණුම්ගත නොවූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ මෙම ශේෂය රු.1,626,000 ක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී පිළිගැනීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ආපසු ගෙවන ඇප තැන්පතු | 1,736,681 | තැන්පතු හිමියන්ගේ විස්තර |
| (ආ) | ක්‍රියාත්මක නොවන වෙළඳසැල් වලට අදාළ බදු කුලී | - | වෙළඳසැල් පිළිබඳ විස්තර |
| (ඇ) | සනීපාරක්ෂක සේවා සැපයුම් සමාගමට ගෙවිය යුතු බිල් | 2,840,158 | සමාගම විසින් භාරයට එරෙහිව පවරා ඇති නඩුව සම්බන්ධ විස්තර |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය හිමියෝ හා අනෙකුත් වගකීම් යටතේ ඉකුත් වර්ෂයේ සිට දක්වා තිබුණු එකතුව රු.1,546,494 ක් වූ ශේෂයන් හතරක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ ජංගම වත්කම් වලින් සියයට 88 ක් හෙවත් රු.66,223,408 ක් ලැබිය යුතු කුලී ආදායම වන අතර, කඩකුලී අයකිරීම සම්බන්ධ කළමනාකාරීත්වයේ අවදානය දුර්වල තත්ත්වයක පැවතුණු බව නිරීක්ෂණය විය.

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජකාරී ආවරණය කිරීම සඳහා පත්කරනු ලැබ තිබුණු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සැලසුම් සහකාරවරියකට ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.5 උප වගන්තියට පටහැනිව 2011 වසරේ මාස 9 දින 15 ක් සඳහා රු. 212,500 ක දීමනාවක් ගෙවා තිබුණි. 2011 දෙසැම්බර් මාසයේ පරිපාලන සම්බන්ධීකාරක තනතුරේ රාජකාරි අදාළ නිලධාරිණියගේ රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කිරීමෙන් පසු එම සාමාන්‍ය රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් දීමනාවක් ගෙවිය නොහැකි වුවද 2013 දෙසැම්බර් දක්වා රු. 570,000 ක් මෙම නිලධාරිනියට දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) අදාළ නිලධාරිනියට පරිපාලන සම්බන්ධීකරණ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සතියට දින 3 ක් රාජකාරි නිවාඩු අනුමත කර තිබුණද භාරයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් කර නොතිබීම හේතුවෙන් අදාළ දිනවල නිලධාරිනියගේ රාජකාරියට පැමිණීම තහවුරු කරගත නොහැකි විය.

(ඇ) මෙකී නිලධාරිනියට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008(iv) ට පටහැනිව ලීටර් 120 ක මාසික ඉන්ධන දීමනාවක් ගෙවීමට ලේකම්වරයා අනුමත කර තිබූ අතර ඉන්ධන දීමනා ලෙස 2013 නොවැම්බර් සිට 2014 නොවැම්බර් දක්වා රු. 188,400 ක් ගෙවා තිබුණි.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) කළමනාකරණ භාර ලියවිල්ල | |
| 8(අ) ඡේදය | කළමනාකරණ භාර රැස්වීම් යටත් පිරිසෙන් දෙමසකට වරක්වත් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් 05 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 2 වගන්තිය | "භාරය" ආදායම් බදු බැඳියාවට යටත් විය යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | |
| 10 වගන්තිය | භාරය එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. |
| 22 (2) වගන්තිය | (i) භාරයේ යෙදවුම් බදු වෙනුවෙන් බදු බැර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) යෙදවුම් මත ගෙවන ලද එකතු කළ අගය මත බදු මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| මුදල් රෙගුලාසි 756 හා 757 | (i) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පිටපතක් වහාම විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත් 2013 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2014 නොවැම්බර් 11 දිනදීය. |

(ii) ආපන ශාලාවට ලබා දී තිබූ රු. 275,249 ක් පිරිවැය වූ උපකරණ 4 ක් භෞතිකව සමීක්ෂණය කර වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

මුදල් රෙගුලාසි 396 (ඇ)

2011 වර්ෂයේ නිකුත් කරන ලද එහෙත් ගෙවීමට ඉදිරිපත් නොකරන ලද රු. 294,250 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මාර්ගෝපදේශ අංක - 3.2

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ පිරිසිදු කිරීමේ සේවාව පෞද්ගලික ආයතනයකට පවරා තිබුණු අතර එම ආයතනය සමඟ 2012 පෙබරවාරි 14 දින සිට 2017 පෙබරවාරි 13 දින දක්වා වර්ෂ 5 ක් වැනි දීර්ඝ කාලයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි.

(ii) පිරිසිදු කිරීමේදී අධි පීඩන ජල විදුලි උපකරණ භාවිතා කළ යුතු බවට කොන්දේසි ගිවිසුමේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සාමාන්‍ය ජල නල භාවිතා කර තිබුණු අතර ඒ තුළින් අධික ජල පරිභෝජනයක් සිදුව තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ජල පාරිභෝජන පිරිවැය රු. 7,948,948 ක් වී තිබුණි.

(iii) ගිවිසුමේ 7 වන වගන්තිය ප්‍රකාරව පිරිසිදු කිරීම සඳහා කම්කරුවන් හා අධීක්ෂකවරුන් මසකට මිනිස් දින 1110 ක් වන පරිදි යෙදවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මාසිකව මිනිස් දින 171 - 328 අතර ප්‍රමාණයක් අඩුවෙන් යොදවා තිබුණි.

(ඊ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04.1 ඡේදය

භාරයේ වාර්ෂික අයවැය ලේඛනය පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 ට පෙර අදාළ ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 25,873,482 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 863,735 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,009,747 ක පිරිහීමක් දක්නට ලැබුණි. කුළී ආදායම් රු. 20,536,000 කින් අඩුවීම සහ කළමනාකරණ ගාස්තු රු.5,148,000 කින් ද ගොඩනැගිලි නඩත්තු වියදම් රු. 1,290,000 කින් ද වැඩිවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

වෙළඳ සංකීර්ණය පිහිටුවීමට අවශ්‍ය කරන වත්කම් හා යටිතල පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජය විසින් දරා තිබුණු වියදම රු. 2,073,693,568 ක් වූ අතර භාරය පිහිටුවීමේ පරමාර්ථ හා කාර්යයන් වන්නේ වෙළඳ සංකීර්ණයේ පූර්ණ පාලනය සහ කළමනාකරණය භාර ගැනීම, එකී සංකීර්ණය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම, කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම හා ඊට අනුෂාංගික කාරණා ගැන කටයුතු කිරීමයි. ඊට අදාළ වගකීම් රාශියක් භාරයට පැවරී ඇති අතර භාරයේ සියළු ආදායම් නිසිපරිදි අයකර ගැනීමත් වියදම් මනාලෙස කළමනාකරණය කර ගැනීමත් සිදුවිය යුතු වුවත් එම කාර්යයන් නිසිපරිදි ඉටුකිරීමට භාරය අසමත්ව ඇති බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

**(අ) රථ වාහන අංගනයේ ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනයේ ආදායම් එකතු කිරීමේ කටයුතු භාරය විසින් ලංකා ධීවර සංස්ථාව වෙත පවරා තිබූ අතර සංස්ථාව එම කාර්ය සඳහා තෙවන පාර්ශවයක් වූ සමාගමක් සමඟ භාරයේ අනුමැතියකින් තොරව වසර 10 ක දීර්ඝ කාලීන ගිවිසුමකට එළඹ තිබුණි.

(ii) ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) සමාගම විසින් එකතු කරනු ලබන ආදායමෙන් අඩුකළ හැකි වියදම් පිළිබඳව ගිවිසුමට ඇතුළත් වී නොතිබූ අතර භාරයට ආදායම් ප්‍රේෂණය කිරීමේදී සේවක වැටුප් රු. 1,428,917 කින් වැඩිපුර අවකරණය කර තිබීම හේතුවෙන් භාරයට අහිමිවී තිබූ ආදායම රු. 428,675 ක් විය.

(iv) සමාගමේ 2012/2013 හා 2013/2014 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිටපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.5,618,204 ක් වූ කළමනාකරණ භාරයේ රථවාහන නවතා තැබීමේ කුළී ආදායමේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(v) 2011, 2012 හා 2013 වර්ෂවලට අදාළව සමාගම අයකර ගෙන ලංකා ධීවර සංස්ථාවට ප්‍රේෂණය කරනු ලැබූ ආදායමෙන් භාරයට අයවිය යුතු රු.18,398,680 ක් ධීවර සංස්ථාව වෙතින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(vi) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථ වාහන අංගනය දෛනිකව පරිහරණය කරන ව්‍යාපාරිකයින් සඳහා නිකුත් කරනු ලබන සාමාජික කාඩ්පත් ගාස්තු වලට අදාළ භාරයේ ආදායම සමාගමේ ආදායම් වාර්තා අනුව රු. 265,185 ක් වූ අතර මෙකී ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කරගත හැකි ක්‍රමවේදයක් භාරය විසින් සකස් කරගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වාහන 1,366 ක් සඳහා සාමාජික කාඩ්පත් ලබාගෙන තිබූ අතර එම වාහන සඳහා සෑම මාසයකදීම සාමාජික කාඩ්පත් ගාස්තු ගෙවුවේ නම් භාරයට ලැබිය යුතු ආදායම් කොටස රු. 22,136,400 ක් විය.

(ආ) වෙළඳසැල්වල කුළී ආදායම විධිමත්ව අයනොවීම හේතුවෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වෙළඳසැල් 128 කින් යුතුව ඉදිකර තිබූ සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 64 ක් 2011 හා 2012 වර්ෂවලදී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පත් කර තිබුණද, විගණිත දිනය වූ 2015 මාර්තු 27 වන විට මෙම වෙළඳසැල් 64 හා සිල්ලර වෙළඳසැල් වශයෙන් පවතින වෙළඳසැල් 64 න් වෙළඳසැල් 34 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ii) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ තක්සේරු වටිනාකමට ව්‍යාපාරික ස්ථාන වලින් බදුකුලී අය කිරීමට භාරය කටයුතු කර නොතිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අහිමි වූ බදුකුළී ආදායම රු. 36,960,000 ක් විය.

(iii) භාරය සතු දේපල කුලියට දීමේදී ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුවක් ලබා ගැනීමට කටයුතු කර තිබුණද, එකතුව රු.14,020,000 ක් වූ ඇප තැන්පත් අදාළ පාර්ශව වෙතින් ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම දේපලවලට වන හානිය පියවා ගැනීම හෝ හිඟ බදුකුලිය අයකර ගැනීම සම්බන්ධයෙන් වන අවදානම භාරයට දැරීමට සිදුවී තිබුණි.

(iv) සිල්ලර වෙළඳ සංකිර්ණ ගොඩනැඟිල්ලේ කුළියට දීම සඳහා ඉදිකර තිබූ මාසික තක්සේරු වටිනාකම රු.14,000 බැගින් වූ වෙළඳ සැල් 16 න් 02 ක් පොලිස් නිලධාරීන්ගේ පරිහරණය සඳහාද එක් වෙළඳ සැලක් ආපන ශාලා සේවකයින්ගේ පරිහරණය සඳහාද ගාස්තු අයකිරීමෙන් තොරව ලබාදී තිබුණි.

(ඇ) වෙළඳ සංකීර්ණ පරිශ්‍රය තුළ පිහිටි ගොඩනැගිලි කීපයක අත්තිවාරම්වල කොන්ක්‍රීට් තට්ටුවට යටින් පොළව ගිලා බැස ජලය පිරී තිබූ අතර පරිශ්‍ර භූමිය හා මාර්ගවල තැනින් තැනද ගිලා බැස අපවිත්‍ර ජලය පිරී තිබුණි. මෙකී ගොඩනැඟිලි ගිලා බැසීමේ අවදානම සම්බන්ධයෙන් පරීක්ෂා කරවාගෙන වාර්තාවක් ලබා ගැනීමට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට සමාලෝචිත වර්ෂයේදී රු. 628,120 ක් ගෙවා තිබුණද භූමිය යථාතත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබූ අතර අදාළ වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) කළමනාකරණ භාරයේ සේවයේ නියුතුව සිටි නිලධාරිනියක අනුමැතිය රහිතව ලබාගත් නිවාඩු දින 50 ක් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා වැටුපෙන් අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**4.2** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) අපද්‍රව්‍ය ටැංකියක් ඉදිකිරීම **සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) වෙළඳ සංකීර්ණයේ ඉවත දමන අපද්‍රව්‍ය වියළා කුඩුකොට අළෙවි කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් විසින් ඔවුන්ගේ වියදමින් යන්ත්‍රාගාරවලින් සමන්විත ගොඩනැගිල්ලක් සංකීර්ණ භූමියෙහි ඉදිකර තිබූ අතර ඒ සඳහා භාර මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii) ගොඩනැඟිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් අදාළ ආයතනය සමඟ බදු ගිවිසුමකට එළඹීමට හා භූමිය වෙනුවෙන් බදුකුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආපන ශාලාව බදු දීම **සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ට පටහැනිව ආපන ශාලාව 2011 අප්‍රේල් 01 දින සිට වසර 10 ක කාලයක් සඳහා රු.129,000 ක මාසික කුලියකට පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණි.

(ii) 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් භාවිතයට ගැනීමෙන් තොරව ආපන ශාලාව තුළ පැවතුණි.

**4.3** **දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ සංකීර්ණයට ආරක්ෂාවට සපයනු ලබන පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම විසින් එක් සේවා මුරයකට ආරක්ෂක නිලධාරීන් 9-12 අතර ප්‍රමාණයක් යොදවා තිබුණද නිලධාරීන් 24 ක් යෙදවූ බවට සඳහන් කර බිල්පත් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2011 ජූනි 01 සිට 2013 ඔක්තෝබර් 31 දක්වා සාවද්‍ය ලෙස රු.15,399,050 ක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත එකතුකල අගය මත බදු ලෙස රු. 1,884,954 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.307,999 ක්ද එකී සමාගමට වැඩිපුර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2012 විගණන වාර්තාවෙන්ද අනාවරණය කළද නිසි සැලකිල්ලෙන් තොරව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා වැඩිපුර ගෙවූ මුදල් ආරක්ෂක සේවා සමාගමෙන් ආපසු අයකර ගැනීමට 2015 මාර්තු 27 දක්වාම භාරය විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2011,2012 හා 2013 වර්ෂවල භාරයේ ඌනතාවයද පිළිවෙලින් රු.4,271,262, රු.6,686,981 හා රු.6,634,659 කින් වැඩි වී තිබුණි.

(ආ) විධිමත් ගිවිසුමක් රහිතව සේවා සපයා තිබූ මෙම සමාගම සමඟ 2011 මාර්තු 31 දින සිට 2015 මාර්තු 30 දක්වා වසර 4 ක කාලයක් ආවරණය වන පරිදි 2014 ජනවාරි 08 දින භාරය ගිවිසුමකට එළඹ තිබූ නමුත් වෙළඳ සංකීර්ණ පරිශ්‍රයට ආරක්ෂක නිලධාරීන් යෙදවිය යුතු ස්ථාන හා නිලධාරී සංඛ්‍යාව කලින් තීරණය කර ඒ පිළිබඳ කොන්දේසි එකී ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

වෙළඳ සංකීර්ණයේ තොග ගොඩනැගිලි සංකීර්ණයේ පොළොවෙහි තින්ත ආලේප කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමකට 2013 ජූනි 10 දින අත්තිකාරම් වශයෙන් රු. 1,289,904 ක් ගෙවීමෙන් අනතුරුව අදාළ කාර්ය ඉටුකර තිබූ අතර ජූලි 11 දින වන විටත් තීන්ත ආලේපය ඉවත්ව ගොස් ඇති බව අනාවරණය වී තිබුණද 2013 ජූනි 17 හා 2013 අගෝස්තු 14 දින පළමු හා දෙවන අතුරු ගෙවීම්ද තාක්ෂණ නිලධාරියෙකුගේ හෝ ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් නොමැතිව ගෙවා තිබුණි. තවද පළමු අතුරු ගෙවීම සිදුකළ අංක 549 දරන රු.1,200,000 ක වවුචරය අනුමත කරද නොතිබූ අතර, ගෙවා තිබූ සම්පූර්ණ මුදල වූ රු. 2,902,280 න් කාර්ය සාධන බැඳුම්කරයේ වටිනාකම වූ රු. 930,000 ක් පමණක් ප්‍රතිපූර්ණය කර ගෙන තිබීම හේතුවෙන් භාරයට රු.1,972,280 ක අලාභයක් සිදුවී තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

වෙළඳ සංකීර්ණයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලංකා ධීවර සංස්ථාවේ කාර්ය මණ්ඩලයෙන් 41 දෙනෙකු සේවයේ යොදවා තිබුණ ද භාරයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය තීරණය කර කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට හා සංවිධාන සටහනක් සකස් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත අරමුදලේ මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් 2013 මුදල් වර්ෂය සඳහා කළමනාකරණ භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලද්දේ මාස 11 කට පසුව එනම් 2015 ජනවාරි 21 දිනදීය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

භාරය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

**5.4 නොවිසිඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණන වාර්තා ඇතුළත් ගිණුම් වාර්තා භාර මණ්ඩලය විසින් සලකා බලා නොතිබුණි.

(ආ) විගණකාධිපති විසින් නිකුත් කර ඇති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. 2012, 2013, 2014 හා 2015 වර්ෂ වලදී නිකුත් කර ඇති විගණන විමසුම් 17 කට 2015 මාර්තු 31 දක්වාම පිළිතුරු සපයා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුයි.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය

(ඇ) ආපසු ගෙවිය යුතු තැන්පතු